සංජීව පොතුපිටියගේ

මත් ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියානු තුම්යෙන් පිට නඩු පැවරුණ පළමු ඕස්ට්‍රේලියානුවා ෂෙපේල් කෝකි නොවුවාසේ ම ඇය වසේ වූ පළමු කාන්තාව ද නොවන්නේ ය. එසේ වෝදනා ලැබ සිටින ඕස්ට්‍රේලියානුවන් ගණන 119 ක් පමණ යැයි සැලකෙයි.- මෙම මාධ්‍ය මාෆියාව මොවුන් ගැන මෙතරම් සෝෂාවක් කළ බවක් වත් අපට සිහියට නොතබමි.

ශෙපේල් කෝකි නම් වූ 27 හැවිරිදි ක්වීන්ස්ලන්ත ප්‍රාන්තවාසී ඕස්ට්‍රේලියානු තරුණිය කි.යූ. 41 පමණ වූ ගංගා කෙවින් මිරප්පලාහා නොගයක් ඉන්දුනිසියාවේ ''බාලි'' පුරවරයට ගෙන ගාමේ වරදට හසුවී අවුරුදු 20 ක සිර දඬුවමක් හා ඉන්දුනිසියා රුපියල් මිලියන 100 ක් වනාම ඕස්ට්‍රේලියානු ඩොලර 1400ලු ක් ඉන්දුනිසියාවේ ඩෙන්පාසා උසාවියේදී, ගී පුද්ගල එතිසුරු මඩුල්ලක් එතින් තීන්දු කරනු ලැබුයේ ඉකුත් 28 වැනි දා ය. රජසවාහිනී තිර ඉදිරිපස රැස් වූ සියලු දෙනා මෙම හඬු තීන්දුව සජීවී ව නැරඹුවේ ත්‍රාසජනක චිත්‍රපටි ජවනිකාවක් මෙනි. අවසානයේ ප්‍රධාන විනිසුරු බසබවැබ ''සර්සව විසින් ෂෙපේල් කෝකිට තම හුදනතෙගන් නැගිටින ලෙස ඇණ කර තම හඬු තීන්දුව ප්‍රකාශයට පත් කළේ සියළු ඕස්ට්‍රේලියානුවන්ගේ හෙතට කෝපය මුසු වූ කදුළු සංවම්මිනි.

තම හඬු තීන්දුව ප්‍රකාශයට පත් කළ අවස්ථාවේ කෝකි හා ඇඟේ මව ඩෙන්පාසා උසාවිය තුළ හැසිරුණේ ඔවුන් කිසිසේත් ම බලපොරොත්තු නොවූ ආකාරයේ ප්‍රතිචලයක් ලබා දුන් ඉතා තුළිප තීන්දුවක් දුන් ''තකතීරු විනිසුරුවරයන්'' යැයි අවලාද නගමිනි. මේ දෙස බලා සිටි මා හට හැඟී ගියේ කෝකිගේ මවට අමම වශයෙන් මසක සිර දඬුවමක් වත් උසාවියට අපහස කිරීමේ වරදට දැන් දැන් තිගම කරාවී යැයි කියා ය. වාසනාවකට හෝ අවාසනාවකට එය වසේ සිදු නොවීණි.

දැන් මේ දුක්බර හැඟීම්බර වූ කථා මාලාව මෙතරම් දුරට රැගෙන ආවේ ඕස්ට්‍රේලියාවට පක්ෂපාතී වූ ජාතිවාදී ශ්‍රව්‍ය හා දෘශ්‍ය මාධ්‍යයයි. ඒ මත්ද යත් ඕස්ට්‍රේලියාවේ පක්ෂපාතී වූ මාධ්‍ය වෙළෙන්දෝ කෝකි හා ඇඟේ දෙවය මසක් පමණ තිස්සේ සරුවට විකුණාගෙන කෑ අතර ම තම උග්‍ර ජාතිවාදී උඩඟු න්‍යාය පත්‍රය ඔසවාලී ජනතාව අතරට ගෙන ගාමට කටයුතු කලෝය. ඒ කෙසේ ද යත් මේ ලොව සුළු ජාතීන්ගේ කෙලි ඛේකි, මිහි රඟන්න ට, නොයෙකුත් කෙළි කරන්නට දෙවීයන් වහන්සේ අපට දායාද කර ඇති අයිතියට අභියෝග කරන්නට කිසිවකුටත් නොහැකි යි යන අයුරිනි. මෙම උග්‍ර පක්ෂපාතී මාධ්‍ය හැක්ෂකයන් එක අතකින් තමන්ගේ ම වරදයේ එකියකගේ ජීවන ඉරණම සරුවට විකුණමින් ලාභ ඉපයූ අතර ඕස්ට්‍රේලියානු ජන සමාජය තුළ පෙර නොවූ අයුරින් ජාතිවාදී, වරණවාදී ගිණි දළු අවුලුවාලීම ට කටයුතු කර ඇති බව මේ දෙස යථාර්ථවාදීව බලන නිහඬම මධ්‍යස්ථ පුද්ගලයෙකු ට පෙනී යා යුතුය.

ඒ මත්ද යත් මෙලෙස මත් ද්‍රව්‍ය ප්‍රවාහනය හෝ පාවිච්චිය සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියානු තුම්යෙන් පිට නඩු පැවරී ඇති පළමු ඕස්ට්‍රේලියානුවා ෂෙපේල් කෝකි නොවූවාසේ ම ඇය වසේ වූ පළමු කාන්තාව ද නොවන්නේ ය. වසේ වෝදනා ලැබ සිටින ඕස්ට්‍රේලියානුවන් ගණන 119 ක් පමණ යැයි සැලකෙන අතර ඉන් 49 ක් පමණ දැනට ඉන්දුනීසියාව වැනි අන්තිදින ආසියානු රටවල සිර දඬුවම් ලබන අතර ඉන් තිදෙනෙකුට මරණ දඬුවම හිමි වී ඇත. මරණ දඬුවම ලැබූ තිදෙනාගෙන් දෙදෙනෙකු ඊයටිනාමයේ ද, අනෙක් පුද්ගලයා සිංගප්පූරුවේ ද තම මරණය බලාපොරොත්තුවෙන් සිරගතව සිටී. මෙම මාධ්‍ය මාෆියාව මොවුන් ගැන ''මෙතරම් සෝෂාවක්'' කළ බවක් යන්තම් හෝ කථා කළ බවක් වත් අපට සිහියට නොනැගේ, ඒ කිසිවක් නිසා නොව ඔවුන්ට මාධ්‍ය තුළ හොඳින් විකුණා ගැනීමට නොහැකි වීම ය. එසට හේතුව ඔවුන් ඕස්ට්‍රේලියානු පුරවැසියන් වූවද ආසියානු සම්භවයක් සහිත වීමය.

ජෝන් හාවඩ් ගේ හදවත දණ්ඩ වී රජයේ වියදමින් හිති විශාරදයින් නොගයවන්න ට ඇත්තේ ''මොවුන් මෙහි පුරවැසියන් වූවත් ආසියානුවෝ! උන් මැරුණ ම අපිට මොකෝ'' යැයි හැඟුන නිසා ද? ඇලෙක්සැන්ඩර් ඩවුනර් මට හින්දිව වැඩි සිටියේ එම සිරකරුවන් ඕස්ට්‍රේලියාවට ගෙන්වා ගැනීමේ අදහස ඔහුගේ මොලයට නොදැනුණේ ඒ තුළින් එතරම් ජන්ද සංඛ්‍යාවක් ලබා ගැනීමට නොහැකි බව සිතූ නිසා ද? මේවාට පිළිතුරු ඇත්තේ ඔවුන්ගේ සිත් තුලය. ෂෙපේල් මෙම මත් ද්‍රව්‍ය ජාවාරම සම්බන්ධයෙන් වැරැදිකරු ද නිවරැදිකරු ද යන්න තීරණය කිරීමේ අයිතිය ඔබට මට තියා ඕස්ට්‍රේලියානු රජයටවත් එහි හෙන්චයියලාටවත් නොමැත. එම අයිතිය ඇත්තේ ඉන්දුනීසියානු නීතියට හා එහි අධිකරණයට ය. එම අනුලංඝනීය වූ අයිතියට ඇතිල්ල දික් කරමින් තරවටු කිරීමට කිසිම ජගතෙකුට නොපුලුවන.

එහෙත් සමහර ඕස්ට්‍රේලියානු මන්ද බුද්ධිකයින් ජාතිවාදීන් හා මාධ්‍ය ඇඳබාලයින් දැනටමත් එය කර ඇවසන් ය. එහි ප්‍රතිඵල ලෙස කැන්බරා හි වෙසෙන ඉන්දුනීසියානු කොන්සල් වරයාට මරණීය තර්ජන දුරකථනයෙන් ලැබීමට පටන් ගෙන ඇත. සමහරන් ඉන්දුනීසියාවේ බාලිවලට යෑම නතර කළ යුතු යැයි කියති. ඕස්ට්‍රේලියානුවන්ට ඉතා ම ලාබට හිවාඩු ගත කරන්නටත් ඉතා ම අඩු මුදලකට ලිංගික ශ්‍රමය සූරා කන්නටත් ලෑම ඇති පාරාදීසය ඉන්දුනීසියාවේ බාලි පුරවරය බව නොරහසකි. මෙහි වෙසෙන දුගී හිඟුදු ආගමික ඉන්දුනීසියානුවෝ අභිංසක පුරවැසියෝ ය. ඔවුහු ලෝකයේ අති මහත් මුස්ලිම් බහුතරයක් සහිත ඉන්දුනීසියාවේ හිඟුදු සුලුතරයක් වීමේ ශාපයේ කෙනෙහිලිකම් වලට ලක් වන බව ද නොරහසකි. දැන් ප්‍රශ්නය වී ඇත්තේ මේ උග්‍ර ජාතිවාදී මාධ්‍ය පිසාචයෝ පළිගන්න ට හදන්නේ මෙම අහිංසක ඕනිසුන්ගේ බඩට කෙළිමෙන් වීම ය. එය මහත් අපරාධයකි. මෙම දුපතේ ඕනිසුන් ජීවත් වන්නේ එහි සංවාරයට එන සුද්දන්ට යමක් විකුණා ඔවුන් සසනසීම තුළිනි. එසේ නොවූවොත් ඔවුන් සදහට ම බඩගින්නේ ය. දරු පවුල් අනාථය.

එක අතකින් ''වවුලාගේ ගෙදරට ගියා නම් එල්ලී හිටු'' කිව්ා සේ මේ රටවල සංචාරය කිරීමේදී ඒවායේ හිති එතින්ට අනුකූල වීම ට සූදානම් වීය යුතු ය. මත් ද්‍රව්‍ය ප්‍රවාහනය හා ජාවරම මරණීය දණ්ඩනයට ගැනෙන වරදක් බව ගුවන් තොටුපලේ ම පොල්ගෙඩි අකුරෙන් ලියා ඇත. ඉන්දුනීසියානු හිතියට අනුව ගංගා ද හෙරොයින් ගණයට වැටෙන භයානක මත් ද්‍රව්‍යක් වන අතර එය ග්‍රෑම් 50 ඉක්මවන්නේ නම් මරණීය දණ්ඩනය ද හියම කල හැකියැයි ඉන්දුනීසියානු අපරාධ හිතිය යටතේ සම්මත කර ඇත. ඕස්ට්‍රේලියානුවන් ට ගංගා එතරම් දෙයක් නොවූවත් එය ඉන්දුනීසියෝන් හිතියේ හැටි ය.

අනෙක් අතට ෂෙපේල් කෝකිගේ හඬු තීන්දුව ඉහල උසාවියට ගෙන ගොස් නැවත සලකා බලා අවශ්‍ය ප්‍රතිපාදන, හිතීඥවරුන්ගේ සහාය ලබා දෙන බවට ඇලෙක්සැන්ඩර් ඩවුනර් විදේශ අමාත්‍යවරයා දැනටමත් සපථ කර ඇත. ඇසිය යුතු තවත් ප්‍රශ්නයක් ඇත. එනම් මෙම වියදම් කරන්නේ ඇලෙක්සැන්ඩර් ඩවුනර්ගේ අම්මාගේ බුදුලයෙන් හොව මෙරට වැඩ කරන ජනතාවගේ බදු මුදල් නිසා එයට උපරිම සාධාරණය සිදුවන්නේ ද යන්න ය. මෙලෙස සෑම මත් ද්‍රව්‍ය ජාවාරම හඬුවකට ම ඉදිරියේදීත් රජය මේ ලෙස මැදිහත් වන්නේ ද නැතහොත් එය සිදුධියෙන් සිදුධියට වෙනස් වන්නේ ද නැතිනම් විදේශයන් හි සිරගත වූවන් ට මෙලෙස කරුණාව පෑවේ ද? යනුවෙන් ඇසිය යුතු ප්‍රශ්න රාශියකි.

ඇලෙක්සැන්ඩර් ඩවුනර් හා මාධ්‍ය මාෆියාව ඉදිරියේදීත් මෙලෙස ම හීනම්බ ඕස්ට්‍රේලියානුවෙක් වෙනුවෙන් එනම් සම්භවය, කළු, දුඹුරු, ආසියාතික කුමක් වුවත් ඉදිරිපත් වන්නේ නම් රජයේ බදු මුදල් වලින් හිති සහාය ලබා දෙන්නේ නම් ඇත්තෙන් ම අපට මොන තරම් සතුටු වීය හැකි ද?. ඇත්තෙන් ම නැත. අප එවැනි ස්වප්නයක ගිලී අන්ධ වීය යුතු නැත. හෙට දිනයේ ඔබ හෝ මම මෙවැනි කරදරයක දැක හෝ නොදැක පැවලුණේ නම් මේ සුදු මහත්වරුන්ගේ සුදු ඝන හමට යටින් ඇති දෙපිටකාරවූ කුහර හතරකින් යුතු හදවතේ රතු රුධිරය දණ්ඩ නොවනු ඇත. පක්ෂශ්‍රාතී බටහිර මාධ්‍ය කුහකයන්ගේ ඟඬ නොහැඟෙනු ඇත. ඒ අන් කිසිවක් නිසා නොව අපට සුදු සම්භවයක් නොතිබීමේ කරදමය හා අපව මැයවීන් බටහිර සංස්කෘතිය තුළ අලෙවි කළ නොහැකි නිසාවෙනි.

■

NOEL AIRCON PTY LTD
නොයෙල් එයා කොන්
PANASDSONIC
TOSHIBA
KELVINATOR
ELECTRLUX
Any type
ඕනෑම වර්ගයක වායු සමීකරණ යන්ත්‍ර
වගකීමක් සහිතව සවිකර දෙනු ලැබේ.
ඉතා සාධාරණ අයකිරීම්.
We beat any price
ව්‍යාපාරික මහතුනි,
ඔබේ වෙළඳ සලට, ආපන ශාලාවට අවශ්‍ය
Cool Rooms හා Freezer Rooms
ඉතා අනර්ඝ රුසක අපි සාදා තිබ කර දෙන්නෙමු.
Installation of
Wall Mounted Split Units
Ceiling Cassete typr
Convertible Type
Recondition of Cool Rooms/Freezer Rooms
Service & Repair
නිමාවෙන් පසු
වගකීම.
අමතන්න
නොයෙල් 0411 112 990
Ph/Fax 03 9774 8991 AH 03 9774 8991
email sue05@ozemail.com.au